අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ :- 469

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

## අධිකරණවල සේවයේ නියුතු උපලේඛනගත නොවන නිලධාරීන් සඳහා දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම සම්බන්ධව

අධිකරණවල සේවයේ යෙදෙන උපලේඛනගත නොවන නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(II), 14/2022(III) සහ 14/2022(IV) ප්‍රකාරව වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේ ප්‍රවණතාව වැඩි වී තිබීම හේතුවෙන් පැන නැඟී ඇති ගැටළු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන ලෙස අධිකරණ අමාත්‍යාංශ ලේකම් විසින් මා වෙත දන්වා ඇත.

02. ඒ අනුව, නිලධාරී පුරප්පාඩු හේතුවෙන් අධිකරණ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට නොහැකි බැවින් ඔබ විසින් උක්ත චක්‍රලේඛ ප්‍රකාරව නිවාඩු ලබා දීම නිර්දේශ කරන්නේ නම් වත්මන් කාර්යය මණ්ඩලය මඟින් එම රාජකාරී කටයුතු කළමනාකරණය කර ගත යුතු බව දන්වමි.

03. තවද නිවාඩු ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය බැවින් එම ඉල්ලීම් අදාළ දිනට සති දෙකකට (02) පෙර අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත ලැබෙන පරිදි යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 සැප්තැම්බර් මස 24 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.